ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.
D.S. Senanayake College, Colombo 07.

තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය
Grade 12

පැය එකයි.
One Hour

# ලංකා සහ යුරෝපා ඉතිහාසය - I පත්‍රය
# Lanka & Europe History - Paper I

## ලංකා ඉතිහාසය

- අංක 01 සිට 05 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනා ගෙන එය වරහන් තුළ සඳහන් කරන්න.

(01) (1) නිස්සංකමල්ල (2) පළමුවන ජයබාහු (3) දෙවන වික්‍රමබාහු
(4) චෝඩ ගංග (5) සහස් මල්ල

(02) (1) මණිමේකලයි (2) ආර්පාක්නම් (3) තිරිවාල්ගාඩු
(4) පල්ලවරායන් පෙට්ටෙයි (5) විදම්බරම්

(03) (1) පරාක්‍රම සමුද්‍රය (2) කවුඩුළු වැව (3) ගිරිතලේ වැව
(4) මින්නේරි වැව (5) කන්තලේ වැව

(04) (1) ජානකී හරණය (2) සියබස්ලකර (3) බුදුගුණ අලංකාරය
(4) සික වලඳ විනිස (5) සමන්ත පාසාදිකා

(05) (1) ආනන්ද විද්‍යාලය (2) රාජකීය විද්‍යාලය (3) සහිර විද්‍යාලය
(4) හින්දු විද්‍යාලය (5) ධර්මරාජ විද්‍යාලය

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතරින් එක් පාද යුගලයක් එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය හඳුනා ගෙන වරහන් තුළ ලකුණු කරන්න.

(06) (1) මල්වතු ඔය - නාච්චදූව
(2) කලා ඔය - කලා වැව
(3). දැදුරු ඔය - යෝධ වැව
(4) යාන් ඔය - හුරුළු ඔය
(5) කනක රායන් ආරු - ඉරණමඩු වැව

(07) (1) ලම්භ කර්ණ පෙළපත - වසභ රජු
(2) මෞර්ය පෙළපත - ධාතුසේන රජු
(3) කාලිංග පෙළපත - පළමුවන විජයබාහු රජු
(4) දඹදෙණි පෙළපත - තුන්වන විජයබාහු රජු
(5) නායක්කාර් පෙළපත - ශ්‍රී විජය රාජසිංහ රජු

(08) (1) මිහින්තලා පුවරු ලිපිය - 4 වන මිහිඳු රජු
(2) අඹගමුව සෙල් ලිපිය - පළමුවන විජයබාහු රජු
(3) දෙවනගල සෙල් ලිපිය - පළමුවන පරාක්‍රමබාහු රජු
(4) දඹුලු සෙල් ලිපිය - නිස්සංක මල්ල රජු
(5) ගල්පොත සෙල් ලිපිය - 4 වන සේන රජතුමා

(09) (1) මහාබෝධි සමාගම - ඩී.බී. ජයතිලක
(2) හලාවත සංගමය - වික්ටර් කොරයා
(3) ලංකා ජාතික සංගමය - පොන්නම්බලම් අරුනාචලම්
(4) ලංකා කම්කරු සංගමය - ඒ.ඊ. ගුණසිංහ
(5) ද්‍රවිඩ සංගමය - පී.පී. පොන්නම්බලම්

(10) (1) කාල වාපි - වසභ රජතුමා
(2) මණිහිර වාපි - මහාසෙන් රජතුමා
(3) පත්ත පාසාන වාපි - දෙවන මුගලන් රජතුමා
(4) ගිරිතට වාපි - දෙවන අග්බෝ
(5) තබ්බ වාපි - දෙවන උදය රජතුමා

**අංක 11 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.**

(11) ලම්භකර්ණ පෙළපතේ පළමු පාලකයා,
(1) යසලාලක තිස්ස (2) වසභ රජු (3) සුභ රජු
(4) පළමු මුගලන් රජු (5) පළමුවන ගජබා

(12) පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ඉදි කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) වලානේ සිද්ධාර්ථ හිමි (2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
(3) රත්මලානේ ධර්මාලෝක හිමි (4) වැලිවිට සරණංකර හිම
(5) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

(13) කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවන ලද්දේ කවුරුන්ද?
(1) එම්.සී. සිද්දි ලෙබ්බේ (2) ටී.බී. ජායා මහතා
(3) එම්.සී. මරික්කාර් (4) බද්උද්දීන් මොහොමඩ් මහතා
(5) අබ්දුල් හමීඩ් මහතා

(14) දෙවන ගජබා රජු හා පළමු වන පරාක්‍රමබාහු රජ අතර ඇති කරගන්නා ලද ගිවිසුම අඩංගු වී ඇති සෙල් ලිපිය කුමක් ද?
(1) දෙවන ගල සෙල්ලිපිය (2) සංගමු විහාර සෙල්ලිපිය
(3) බදුලු ටැම්ලිපිය (4) කොන්ඩවට්ටාන් ටැම් ලිපිය
(5) තෝනිගල සෙල්ලිපිය

(15) විජිතපුර බිඳ වැටීමෙන් පසු එළාර රජුට ආධාර පිණිස පැමිණ දකුණු ඉන්දීය ප්‍රධානියා කවුරුන්ද?
(1) හල්ලුක (2) පුලහට්ටි (3) දීඝ ජන්තු (4) පනසමාර (5) දාඨිකා

(16) වසරකට කන්න 3 ක් වගා කළ යුතු බව සඳහන් සෙල්ලිපිය වන්නේ,
(1) කොන්ඩවට්ටාන් ටැම් ලිපිය (2) ගොඩවාය ටැම් ලිපිය
(3) කොනිගල සෙල්ලිපිය (4) රජගල සෙල්ලිපිය
(5) තෝනිගල සෙල්ලිපිය

(17) බුද්ධඝෝෂ හිමියන් ලංකාව වැඩම කළේ කුමන රජුගේ කාලයේ දී ද?
(1) මහනාග රජුගේ පාලන සමයේ (2) බුද්ධදාස රජතුමා
(3) දෙවන අග්බෝ (4) මහසෙන් රජතුමා
(5) ධාතුසේන රජතුමා

(18) පොළොන්නරුවේ ඇති රන්කොත් වෙහෙර කුමන රජු විසින් ඉදි කළේද?

(1) පළමුවන පරාක්‍රමබාහු රජතුමා (2) නිස්සංකමල්ල රජතුමා
(3) පළමුවන විජයබා රජු (4) ලීලාවතී රැජිණ
(5) සහස්මල්ල රජු

(19) ඇළහැර ඇල ඉදිකළ රජු වන්නේ,

(1) වසභ රජු (2) ධාතුසේන රජු
(3) පළමුවන සේන රජු (4) දෙවන අග්බෝ රජු
(5) මහසේන රජු

(20) වසර 2 ක් අභය ගිරි විහාරයේ වාසය කළ භික්ෂූන් වහන්සේ (විදේශීය),

(1) පාහියන් හිමි (2) හියුන්සාන් හිමි
(3) බුද්ධඝෝෂ හිමි (4) සංඝමිත්‍රා හිමි
(5) විදේහ හිමි

## යුරෝපා ඉතිහාසය

- **ප්‍රශ්න අංක. 21 සිට ප්‍රශ්න අංක. 40 දක්වා යුරෝපා ඉතිහාසය ඇසුරින් පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක. 21 සිට 30 දක්වා ප්‍රශ්නවල නොගැළපෙන අංකය තෝරන්න.**

(21) (1) පිරනිස් (2) ඇල්ප්ස් (3) ඇපනයින්ස්
(4) කොකේසස් (5) ඇපලාඩියන්

(22) (1) ටයිබර් (2) හඩ්සන් (3) ඩැනියුබ්
(4) රයින් (5) වොල්ගා

(23) (1) ජේම්ස් හා ග්‍රිව්ස් (2) රිචඩ් ආත්රයිට් (3) ඩෙම්ලර්
(4) රොබට් පුල්ටන් (5) ඔලිවර් කොම්වෙල්

(24) (1) ලැන් කැස්ටර් (2) ෆ්‍රැන්ක් (3) යෝර්ක්
(4) ටියුඩර් (5) හැනොවර්

(25) (1) බොස්පරස් (2) ඩාර්ඩනල්ස් (3) ජිබ්‍රෝල්ටා
(4) මලක්කා (5) පැනමා

(26) (1) රොබට් වොල්පොල් (2) රොබට් ඕවන් (3) හෙන්රි පාමස්ටන්
(4) බෙන්ජමින් ඩිස්රායල් (5) විලියම් ග්ලැස්ස්ටන්

(27) (1) ඩ්‍රැකෝ (2) සෝලෝන් (3) ක්ලිස්තිනිස්
(4) පෙරික්ලීස් (5) ජස්ටිනියන්

(28) (1) ඇතැන්ස් (2) ස්පාටා (3) ක්‍රිමියා
(4) තිබ්ස් (5) කොරින්ත්

(29) (1) ඇලෙක්සැන්ඩර් (2) ඔගස්ටස් (3) ඩයොක්ලිසන්
(4) කොන්ස්ටයින් (5) තියඩොසියස්

(30) (1) යුප්‍රටිස් (2) ක්‍රීට් දූපත (3) සයිප්‍රස්
(4) සිසිලි (5) කෝර්සිකා

**ප්‍රශ්න අංක. 31 සිට 35 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ගැළපෙනුයේ පහත වගුවේ 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන් තුළ යොදන්න.**

| | පළමු යුගලය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි | වැරදියි. |
| (2) | නිවැරදි | නිවැරදියි. |
| (3) | වැරදියි | වැරදියි. |
| (4) | වැරදියි. | නිවැරදියි. |
| (5) | නිවැරදියි. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (31) | ග්‍රීක පෞර රාජ්‍යවල ප්‍රජාතන්ත්‍රවාදී හැඩගැස්ම ඇතැන්ස් රාජ්‍යයෙන් ඉතාමත්ව මැනවින් පැහැදිලි වේ. | වැඩිහිටි පිරිමි පුරවැසියන් සියලු දෙනාට විවෘත වූ විවෘත වූ මන්ත්‍රණ සභාවේ දී රාජ්‍ය කටයුතු සම්බන්ධයෙන් වැදගත් ප්‍රශ්න විවාද කොට ජන්දය දුන්හ. |
| (32) | පුරාණ ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම කාර්ය සිද්ධිය නම් ග්‍රීක නිතිය යි. | වර්පිල් සහ හොරස් පුරාණ රෝමයේ සිටි ප්‍රසිද්ධ කවියන් දෙදෙනෙකුය. |
| (33) | පැරසෙල්සස් රුධිර සංසරණ පද්ධතිය සොයා ගත්හ. | උත්කෘෂ්ඨ විප්ලවය සමයේ දී එංගලන්තය පාලක පළමු වන චාල්ස් රජතුමා හිස ගසා මරණයට පත් කළහ. |
| (34) | 1774 ප්‍රථම මහාද්වීපික සම්මේලනයේ දී සුප්‍රසිද්ධ තේ සාදය වූ බෝස්ටන් තේ සාදය ලෙස හැඳින්වේ. | ඇමෙරිකානු විප්ලවයේ දී ඇමෙරිකානුවෝ නිදහස සමානාත්මකතාව හා සහෝදරත්වය යන සටන් පාඨ භාවිතා කළහ. |
| (35) | 1945 දෙවන ලෝක යුද්ධයෙන් මිත්‍ර පිළ ජයගත්හ. | 1945 දී ජර්මනිය දෙකඩ විය. |

- **ප්‍රශ්න අංක. 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

(36) දේශ ගවේෂණය මුලිකව ආරම්භක කළ රට වූයේ,
(1) පෘතුගාලය යි. (2) ප්‍රංශය යි. (3) ඉතාලිය යි.
(4) ස්පාඤ්ඤය යි. (5) එංගලන්තය යි.

(37) නැපෝලියන්ගේ පරාජයෙන් පසු යුරෝපයේ පවත්වන ලද සම්මේලනය වූයේ,
(1) ජිනිවා සමුළුව (2) වියනා සම්මේලනය (3) පැරිස් සමුළුව
(4) ජාතින්ගේ සම්මේලනය (5) මොස්කව් සමුළුව

(38) ඇමෙරිකානු නිදහස් සටහනට නායකත්වය සැපයු ඇමෙරිකානු නායකයා වූයේ,
(1) ජෝර්ජ් වොෂිංටන් (2) ලින්කන් (3) ජෝර්ජ් එන්. කෙනඩි
(4) පැන්ලිඩ් රුස්වෙල් (5) ලාසලේ

(39) කාර්මික විප්ලවයේ දී මැකඩම් ක්‍රමයට ගොඩ ගනු ලැබුවේ,
(1) හෙන්රි මැකඩම් (2) රොබට් පුල්ටන් (3) හිම් කොමන්
(4) රොබට් රැන්වෙල් (5) ජෝන් රොටල්

(40) නැපොලියන් ප්‍රංශයේ ඇති කළ පාසල් වර්ගය වූයේ,
(1) ලඕසිස් (2) ඉම්පිරියල් (3) ලයිසියම්
(4) ඇකඩමි (5) වලහි

තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය
Grade 12

ලංකා සහ යුරෝපා ඉතිහාසය - II පත්‍රය
Lanka & Europe History - Paper I

පැය තුනයි.
Three Hours

## යුරෝපා ඉතිහාසය

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. ඊට අමතරව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් ස්ථානයන් යුරෝපා සිතියමක ලකුණු කර ඉන් දෙකක් ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.

(1) ඇතැන්ස් (2) රෝමය (3) සිසිල් දූපත (4) ලන්ඩන්
(5) බෝල්ටික් මුහුද (6) ඩැනියුබ් ගඟ (7) කොන්තන්තිනෝපලය (8) කළු මුහුද

(02) පුරාණ ග්‍රීකයන්ගේ සංස්කෘතියේ පහත දැක්වෙන අංශවලින් ඕනෑම දෙකක ඔවුන්ගේ කාර්ය සංසිද්ධිය කෙටියෙන් විස්තර කරන්න.

(1) ආගම (2) කලාව සහ ගෘහ නිර්මාණ ශිල්පය
(3) සාහිත්‍ය (4) දර්ශනය

(03) (1) මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිහි වීමට තුඩුදුන් ප්‍රධාන සාධන කෙටියෙන් පැහැදිලි කරන්න.
(2) දේශපාලන හා, සමාජ ආර්ථික ක්‍රමයක් ලෙස වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

(04) එංගලන්තයේ කාර්මික විප්ලවයෙන් උද්ගත වූ ආර්ථික හා සමාජ ප්‍රතිඵල පැහැදිලි කරන්න.

(05) ප්‍රංශ විප්ලවය ඇති වීමට තුඩුදුන් දේශපාලන ආර්ථික හා සමාජ පසුබිම පැහැදිලි කරන්න.

(06) නැපෝලියන් බොනපාට්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්තිය විචාරාත්මකව පැහැදිලි කරන්න.

(07) පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් ඓතිහාසික වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(1) ඇමෙරිකානු නිදහස් සටන (2) එංගලන්තයේ පාර්ලිමේන්තු ක්‍රමය
(3) තිස් අවුරුදු යුද්ධය (4) රෝමයේ සාහිත්‍ය හා කලාව
(5) ස්ලාම් ශිෂ්ඨාචාරය

# ලංකා ඉතිහාසය

**පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඊට අමතරව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් ස්ථානයන් ලංකා සිතියමක ලකුණු කර ඉන් ස්ථාන දෙකක ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | අනුරාධපුරය | (2) | මහාතිත්ථ | (3) | මාතලේ | (4) | ගාල්ල |
| (5) | මහනුවර | (6) | මඩකලපුව | (7) | දඹකොළ පටුන | (8) | තුරුළු වැව |

(ලකුණු 18)

(02) මහසෙන් රජුගේ පාලන සමය අවසානය දක්වා ලංකා ඉතිහාසය හැදෑරීමේලා උපයෝගී කරගත හැකි ප්‍රධාන මූලාශ්‍රය වන්නේ මහාවංශයයි.

(1) මහාවංශය රචනා කරන ලද්දේ කවුරුන්ද? (ලකුණු 1)

(2) මහාවංශයට පදනම් කරගත් මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(3) මහාවංශයේ සඳහන් වන දේශපාලන තොරතුරු සෙල්ලිපි වලින් සනාථ වේ. උදාහරණ හතරක් සපයන්න. (ලකුණු 4)

(4) මහසෙන් රජුගේ පාලන සමය අවසාන දක්වා ශාසනික ඉතිහාසය හැදෑරීමේලා මහාවංශයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 7)

(03) දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දේශපාලන හා සංස්කෘතික වශයෙන් වැදගත් වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(04) වළගම්බා රජුගේ දේශපාලන හා ආගමික කාර්යයන් පැහැදිලි කරන්න.

(05) පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් පළමුවන පරාක්‍රමබාහු රජුගේ කාර්යය සාපලය ප්‍රමාණය පැහැදිලි කරන්න.

(1) දිවයින එක්සත් කිරීම. (2) විදේශ සම්බන්ධතා (ලකුණු 4)

(06) පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් ඓතිහාසික වැදගත්කම පැහැදිලි කරන්න.

(1) ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීම.

(2) පණ්ඩුකාභය රජු

(3) මහසෙන් රජුගේ වාරි කටයුතු

(4) සෙල්ලිපි

(5) ශ්‍රීලංකාවේ වරායන් (ලකුණු 14)

(07) ක්‍රි.ව. 1818 උඩරට කැරැල්ලට බලපෑ හේතු හා කැරැල්ලේ ප්‍රතිඵල විචාරත්කම පැහැදිලි කරන්න. (ලකුණු 14)

***



